---

**බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---

01. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 පෙබරවාරි 14 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයේ පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2011 දෙසැම්බර් 31 දිනට බෝපේ පෝද්දල ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.2,302,963 ක වියදම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් වර්ෂයේ වියදම් රු.2,302,963 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති වෙනුවෙන් ලැබිය යුතු රු.871,667 ක මූලධන ආධාර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් වර්ෂයට අදාල ආදායම් හා ණයගැතියන් රු.871,667 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.13,910,524 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.8,500,000 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.5,410,524 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) වැටුප් ප්‍රතිපූර්ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.8,781,367 ක මුදල සියලුම වැඩ සටහන් අතර විභජනය නොකර, එක් වැඩ සටහනක් යටතේ පමණක් සටහන් කර තිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 29,959,138 | හිමිකම් ඔප්පු හා තක්සේරු වාර්තා |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,032,009 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු හා සවිකිරීම් | 2,268,832 | සමීක්ෂණ මණ්ඩල වාර්තා, ස්ථාවර වත්කම් ලේඛන හා උප ලේඛනය |
| ණයහිමියෝ | 34,400,384 | ශේෂ සනාථ සහතික |
| ආදායම් ණයගැතියෝ | 53,360,451 | ශේෂ සනාථ සහතික |
| තැන්පත් | 3,640,272 | උපලේඛනය |

**02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,140,220 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,131,970 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 11,586 | 5,937 | 16,855 |
| (ii) | බදු කුලී | 1,523 | 2,003 | 592 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 41 | 205 | 143 |
| (iv) | වෙනත් ආදායම් | 25,604 | 24,924 | 35,770 |

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 595,127 |
| (ii) | මුද්දර ගාස්තු | 13,259,376 |

**2.2.3 කඩකාමර බදුකුලී**

ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 13 කින් රු.83,810 ක මුදලක් මාස 03 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. කඩ කාමර සඳහා එම ගිවිසුම් අත්සන් කර වර්ෂ 10 ට වැඩි කාලයක් ගත වී තිබුණ ද, කඩ තක්සේරු කර, බදුකුලී වැඩි කිරීමට හෝ බදු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 මස්කඩ බදුකුලී**

වර්ෂ 12 කට වැඩි කාලයක සිට බදුකරුවන් 04 දෙනෙකුගෙන් රු.306,603 ක මස්කඩ බදු කුලී මුදලක් අයවීමට තිබූ බව නිරීක්ෂණය විය.

**2.3 අවිධිමත් ගනුදෙනු**

**(අ)** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 19(1) වගන්තියට පටහැනිව පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතියක් හා විධිමත් පත්වීම් ලිපියක් නොමැතිව ආයුර්වේද වෛද්‍යවරියක් 2010 මැයි සිට 2012 මාර්තු දක්වා සේවයේ යොදවා වැටුප් වශයෙන් රු.318,335 ක් ගෙවා තිබුණි.

(ආ) ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක: දපස/ප්‍රඅ/පපා/2/52 හා 2011 ජුනි 28 දිනැති ලිපිය මගින් පළාත් පාලන ආයතන ක්‍රීඩා උළෙල සඳහා රු.25,000 ක මුදලක් සභා අරමුදලින් දැරීම සඳහා අනුමත කර ඇතත්, සභාව මගින් එහි අනුමත මුදල ඉක්මවා වැඩිපුර රු.21,953 ක මුදලක් වැයකර තිබුණි.

**2.4 මෙහෙයුම් / කළමනාකරණ අකාර්යක්ෂමතා**

**(අ)** නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති විසින් 1992 සැප්තැම්බර් 30 දින නිකුත් කළ අංක: 3/2/1/10(ii) දරන චක්‍රලේඛය ප්‍රකාරව හෙක්ටයාර් 01 කට වැඩි සෑම අනු බෙදීමකින්ම වීථි අත්හැරීමෙන් පසු ඉඩම් ප්‍රමාණයෙන් 10% ක් පොදු කටයුතු සඳහා සභාවට වෙන් කළයුතු බව දක්වා ඇතත්, සභා බලප්‍රදේශයේ වෙන්දේසි මගින් සභාවට වෙන්කර දී තිබූ ඉඩම් කැබලි 10 කට අදාලව පර්චර්ස් 171.36 ක ප්‍රමාණයකට හිමිකම්/තෑගි ඔප්පු ලබාගෙන නොතිබුණි.

**(ආ)** 2003 ජුනි 02 දිනැති අංක: PED/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**2.5 මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම**

කර්මාන්තය සඳහා සභාවේ කාර්මික නිලධාරී විසින් දින රහිතව රු.100,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර, 2011 දෙසැම්බර් 30 දින ග්‍රාම සංවර්ධන සමිතියක් සමග රු.97,472 කට ගිවිසුම් අත්සන් කර තිබුණි. කොන්ත්‍රාත් කාලය මාස 03 ක් විය. රු.90,825 ක් වූ දින රහිත පළමු හා අවසන් ගෙවීම් වාර්තාව අනුව 2012 මාර්තු 09 දින රු.81,717 ක් කොන්ත්‍රාත්කාර සමිතිය වෙත සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

මුල් ඇස්තමේන්තුවට අමතරව වැඩ කොටස් ඉටුකර තිබීම හේතුවෙන් කාර්මික නිලධාරී විසින් දින රහිතව රු.300,000 ක සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කර තිබුණ ද, එයට සභාවේ අනුමැතිය ලැබී නොතිබුණි. පසුව මුල් ඇස්තමේන්තුවට අමතරව සිදු කරන ලද වැඩ කොටස් සඳහා 11 අදියර ලෙස රු.197,000 ක ඇස්තමේන්තුවක් දින රහිතව සකස් කර රු.195,720 කට 2012 මාර්තු 09 දින ගිවිසුම් අත්සන් කර තිබුණි.

මේ අනුව කර්මාන්තයේ වැඩ අවසන් කිරීමෙන් පසු ක්‍රම විරෝධී ලෙස ඉටු කරනු ලැබූ අමතර වැඩ කොටස් සඳහා මාස දෙකකට පසුව ඇස්තමේන්තුවක් සකස් කර, වලංගු නොවන ගිවිසුමකට අත්සන් තබා තිබුණි. එමෙන්ම කාර්මික නිලධාරී සකස් කරන ලද ඇස්තමේන්තුවල, මිනුම් වාර්තා හා ගෙවීම් වාර්තාවල දිනය සඳහන් කර නොතිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය